
# ඝෝෂක සිටාණෝ



සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ධර්ම දානය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර
ස්වාමීන් වහන්සේගේ ඥාති පිරිසක් විසින්

# ඝෝෂක සිටාණෝ

*සම්පාදක :*

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

*ධර්ම දානය :*

පූජ්‍ය අකුරේගොඩ රතනසාර
ස්වාමීන් වහන්සේගේ ඥාති පිරිසක් විසින්

# පුණ්‍යානුමෝදනාව

ඝෝෂක සිටාණෝ නම් වූ මේ කුඩා දහම් පොත පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් සකස්කොට ඇත. පුණ්‍යවන්ත ජීවිතයක මහිමය මෙයින් ප්‍රකාශ වේ. උතුම් පිංකම් කරන අයට ඝෝෂක සිටුතුමා වැනි ශ්‍රේෂ්ඨ ජීවිත ලැබෙති. දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබා ගැනීම සඳහා නිර්වාණ සම්පත්තිය ලබා ගැනීම සඳහා පින අත්‍යාවශ්‍යය. පින් කරගැනීමට මැලි වූවෝ සැමදා දුක් විඳිති. අප්‍රමාදයෙන් කටයුතු කළ සියළු දෙනා ශ්‍රේෂ්ඨත්වයට පත්විය.

මේ ධර්ම දානමය පින මුද්‍රණ වියදම් දැරූ සියලු දෙනාටත්, පරලොව ගිය සැමටත් අත් වේවා. ඒ සැමගේ ජීවිත සැපවත් වේවා. නිවන් සුව අත්වේවා. දෙවියන්ටත් මේ පිං බලයෙන් යහපතක්ම වේවා.

අපවත් වී වදාළ අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන මාහිපාණන් වහන්සේට මේ උතුම් පින බුදුබව පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

අතිගරු පූජනීය මහා කම්මට්ඨානාචාර්ය නා උයනේ අරියධම්මාභිධාන නායක මාහිපාණන් වහන්සේටද මහ සංඝ රත්නයටද, පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේටද සෝදුපත් බැලූ පූජ්‍ය බේරුවල බෝධිවංස ස්වාමීන් වහන්සේටද නිරෝගී සුව දිගාසිරි ලැබේවා. සියලු ප්‍රාර්ථනා සඵල වේවා යි ආශිර්වාද කරමි.

මෙයට,
කාරුණික,

**කහගොල්ලේ සෝමවංස හිමි.**

ගල්දූව ආරණ්‍ය සේනාසනය
කහව
2012. 12. 10

# වචනයක් ...

*පූජාච පූජ නීයානං*
*ඒතං මංගල මුත්තමං*

පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත මෙම දහම් පොත අපගේ ගුරු දේවෝත්තම ත්‍රිපිටක විශාරද පරම පූජනීය කහගොල්ලේ සෝමවංශ මහා ස්වාමීන් වහන්සේගේ ජන්ම දිනය සිහිපත් කරගෙන සිදු කරන ලදී.

ඉහතින් සඳහන් මංගල සූත්‍ර පාඨයට අනුව පිදිය යුත්තන් පිදීම මංගල කරුණකි. අපගේ නායක මාහිමිපාණන් වහන්සේ සසරදී පුරන ලද පාරමී ඇති දෙවියන් සහිත ලෝවාසීන්ගේ ආදර ගෞරවයට පාත්‍ර දස දෙස කිතුගොස පැතිරුණු බොහෝ දෙනාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන නිහතමානී උතුමෙකි.

මේ සියළු පින් බෙලෙන් ඒ මාහිමිපාණන් වහන්සේට නිරෝගී සුව දීර්ඝායුෂ අභිවර්ධනය වී ප්‍රාර්ථනීය බෝධියකින් නිවන් සුව ලැබේවා යි පතමි.

මෙහි සම්පාදක පූජ්‍ය අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේට සහ පොත මුද්‍රණයට දායක වූ සියළු සඥාතීන්ටත් තම තමන්ගේ සියලු දෝෂාන්ධකාරයන් දුරුවී සියළු පැතුම් ඉටු වේවා යි ප්‍රාර්ථනා කරමි. මුද්‍රණ කටයුතු ඉතා විසිතුරු ලෙස සිදු කළ සක්වා මුද්‍රණාලයාධිපතිතුමන් ඇතුලු කාර්ය මණ්ඩලයේ සැමටත් අභිවෘද්ධිය නිරෝගී බව ලැබේවා.

ඔබ සැමට තෙරුවන් සරණයි.

මෙයට,
මෙතැති.

**පූජ්‍ය බේරුවල බෝධිවංශ හිමි**

ගල්දූව ආරණ්‍ය සේනාසනය
කහව - අම්බලන්ගොඩ.
091-7913342
2012. 12. 08

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

ශ්‍රී බුද්ධ වර්ෂ 2552 ව්‍යඤ්ඣ සංවත්වරෙ වසසාන ඍතුවේ නිකිණි මාසයෙ අව දෙවන බුධ දින නොහොත් ක්‍රි. වර්ෂ 2009.07.08 අටවන දිනදිය.

**ශ්‍රී සද්ධර්ම රත්නාවලී 1-11 පොත් වහන්සේ උපයෝගීකර ගනිමින් එහි සඳහන් ඝෝෂක සිටාණන්ගේ කථා වස්තුව වර්තමාන සමාජයට පැහැදිලි සරළ, භාෂාවෙන් ධර්මදානය සඳහා සම්පාදනය කරමි.**

තවද එක් සමයෙක් හි ඉන්දියාවෙහි "අජිත" නම් රටක දුර්භික්ෂ කාලයක් උදාවී එහි වාසය කිරීමේ අපහසුව නිසා නමින් "කොතුහල" නම් එක් මිනිසෙක් තම බිරිඳත් එකම පුත්‍රයාත් රැගෙන කොසැඹෑ නුවරට ගොස් ජීවත්වෙමුයි සිතා ගෙන යාමට හැකි උපකරණද රැ ගෙන මඟට බැස්සෝය. මෙසේ ගමන් කරන ඔවුන් "අහිවාතක" නම් වසන්ගත රෝගයකින් මිය යනු දැක යන්නාවූ, ඔවුන් රැගෙන ගිය ආහාර පාන ද අවසන් විය. සා පිපාසා නිසා දරුවා වඩාගෙන යාමට අපහසු නිසා තම බිරිඳ අමතා "සොඳුර අප ජීවත් වුවොත් තව දරුවෙකු හදාගත හැකි නිසා මේ දරුවා මෙයාකාරයට වඩාගෙන යාමට ශක්තියක් නැති නිසා මෙහි දමා යමු" යි යෝජනා කළේය. ඒ ඇසූ මව පියවරුන්ගේ ළයමෙන් තදනැති නිසා දරු සෙනෙහස බලවත් නිසා මෙසේ කීවේය. "මාගේ ජීවිතය තිබෙනතුරු දරුවා හැර නොයමි" යි කිහ. "එසේනම් දැන් මොකද කරන්නේ" කියා ස්වාමියා ඇසූවිට "දෙදෙනාම මාරුවෙන් මාරුවට දරුවා වඩාගෙන යමු" යයි කී පසු එලෙස දරුවා රැගෙන යන අතර පියාගේ අතට දරුවා ගත්පසු දරුවාට අපහසු කම නිසා අඬන්නටත් මවගේ අතට ගත්පසු දරුවාගේ ඇඬීම නවතින්නටත් විය.

එවිට පුරුෂයා නැවත නැවත කියන්නේ "මේ දරුවත් රැගෙන ගියොත් අප දෙදෙනාත් අතරමඟ මැරෙන එකයි වෙන්නේ දරුවා මෙහි දමා ගියොත් ජීවිත බේරාගෙන තවත් දරුවන් හදා ගතහැකි නිසා තව තවත් බලා නොසිට මේ දරුවා මෙහි දමා අපගේ පණ බේරාගෙන යමු" යයි බිරිඳට කියවන්නට විය. මවගේ දරු සෙනෙහස බලවත් නිසා එම පුරුෂයා සිතින් දරුවාටද මවටද ශාප කරමින් දරුවාත් සමඟම තව තවත් ඉදිරියට යාමේදී දරුවාට අධික තෙහෙට්ටුව නිසා නින්ද ගියේය. ඒ බැව් දැනගත් එම පුරුෂයා බිරිඳ

ඉදිරියෙන් යවමින් ඇ පසුපස යමින් දරුවා ගසක් මුල කොළ අතු අතර තබා ගියේය. මව ටික දුරක් ගොස් ආපසු හැරී බැලිමේදී දරුවා නොමැතිව හිමියා පමණක් එනු දැක විලාප දී "මගේ දරුවා කොහේ දමා ආවද?" යි ඇසු විට "සොඳුර, මට දරුවා වඩාගෙන ඒමට බැරිනිසා අසවල් ගසමුල තබා ආවෙමි" යි කී පසු "අහෝ ස්වාමීනි මා නොනසනු මාගේ දරුවා නැතිව මම ජිවත් නොවෙමි" යි කියමින් ළයෙහි අත්ගසමින් හඬන්නට විය.

ඇයගේ විලාපය බලවත් නිසා නැවත ආපසු ගොස් දරුවා රැගෙන ආවේය. ඔහු විසින් එම දරුවාට කල එම අපරාධය පාප කර්මය නිසා සසර පුරා අපමණ දුක්විපාක වලට ලක්විය. මව විසින් නැවත අපහසුවෙන් නමුත් තම දරුවා වඩාගෙන යන්ට විය. මෙසේ ගොස් ඔවුන් එක් ගොපලු ගමකට පැමිණියහ. එසේ පැමිණි ඔවුන් එක් ගොපලු නිවසක් වෙත ගියේය. එම නිවසේ එදින ගවයන් වෙනුවෙන් මහත් උත්සව දිනයකි. එම නිවසෙහි නිතිපතා දන් වළඳන පසේ බුදුහිමිනමක් වෙත එදිනද දන් වළඳවා උත්සව කළේය. එම උත්සවය සඳහා බොහෝ සෙයින් කිරිබත් ආදිය සකස්කර තිබිණි. ගොපළු තෙම එහි පැමිණියාවූ ඔවුන්ගේ විස්තර ඇසු පසු බොහෝ සෙයින් අනුකම්පාවට පත්ව එහි තිබූ කෑම වර්ග වලින් සංග්‍රහ කළේය. ඔවුන්ට ලැබුණු ගිතෙල් කිරිබත් ආදිය තම ස්වාමියාට පිළිගන්වා "ස්වාමීනි ඔබ සිටියොත් මමත් රැකෙයි. බොහෝ කාලයක් හරියාකාරව ආහාරයක් නොමැතිව සිටීමෙන් දුබල තත්ත්වයට පත්ව සිටින නිසා මේ කෑම ඇති පමණ කන්න" යි කියා ඔහුට පිළිගැන්විය. එම පුරුෂයාද බොහෝ දවසක් මෙවන් රස ආහාරයක් නොව කටුක ආහාරයක් වත් නොලැබුණු නිසා දිරවාගත නොහැකි තරමටම කෑවේය.

මේ අතර ගෙහිමි ගොපළුතුමාද ආහාර අනුභාවයට ගෙන තම ආසනය යට සිටින බැල්ලියකට කිරිබත් දෙනු දැක "දවසගානේ මේ බැල්ලිට ලැබෙන කෑමේ කුසලය" යි සිතිය. එදිනම එම මිනිසාද අධිකව ආහාර ගැනීමේ හේතුව මත මැරී එම බැල්ලියගේ කුසතුල පිළිසිඳ ගත්තේය. ඉන්පසු එම ස්ත්‍රියද තම ස්වාමි පුරුෂයාගේ මිනිය දවා අවසන් වූ පසු එම නිවසේම බැලමෙහෙවර කර සහල් නැළියක් ලබාගෙන එයින් බත් පිස පසේ බුදුරජාණන් වහන්සේට දන් පිළිගන්වා "ස්වාමීනි, මේ පින් මියගිය ස්වාමි පුරුෂයාට වේවා" කියා පින් අනුමෝදන් කර සිතන්නී "මම, මෙහිම නවතිමි මාගේ ස්වාමි දරුවා වූ පසේ බුදුන් වහන්සේ නිරන්තරයෙන්ම මෙම නිවසට වඩිනසේක. එවිට පිළිගැන්වීමට

යමක් තිබුනොත් පිළිගන්වා බොහෝ කුසල් රැස්කරගත හැකියි යමක් පූජාකිරීමට නොතිබුණත් වන්දනාමාන කරගෙන මෙහි සිටියොත් බොහෝ කුසල් රැසකර ගත හැකි" යයි සිතා එහිම බැලමෙහෙ කොට නැවතින.

මුලින් සඳහන් කළ බැල්ලියද මාස කිහිපයකට පසුව එකම බලුපැටියකු බිහිකළහ. ගොපළු තුමාද එම බලුපැටියාට එක් දෙනකගේ කිරි වෙන්කර දුන්නේය. ඒ අනුව බලුපැටියාද ඉතා ඉක්මනින්ම හැඩි දැඩි බල්ලෙක් බවට පත්විය. පසේ බුදුරජාණන් වහන්සේ වළඳන වේලෙහි මෙම බල්ලාට බත් පිඬක් දෙන සේක. ඒ අනුව එම බල්ලාද පසේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි මහත් සෙනෙහෙයක් ඇතිකර ගත්තේය. ගොපළු තෙමේද පසේ බුදුරජාණන් වහන්සේට උපස්ථානය පිණිස දවසකට දෙවරක් විහාරස්ථානයට යන්නේය. යන එන පාරෙහි චණ්ඩ සතුන් ගැවසෙන නිසා ඔවුන්ගේ ආරක්‍ෂාවීම පිණිස බල්ලා ද කැටිවම යන්නේය. මෙසේ යාමේදී බල්ලාට තනිවම ගොස් දානය සඳහා පසේ බුදුන් වහන්සේ වඩමවා ගෙන ඒමට හැකි බැව් වටහාගත් ගොපළු තෙමේ විහාරයට ගොස් මෙසේ පැවසිය.

"ස්වාමීනි, මට ඒමට නොහැකි වන අවස්ථාවලදී මේ බල්ලා එවන්නෙමි. එම සලකුණු අනුව අප කෙරෙහි අනුකම්පාවෙන් අපගේ නිවසට වැඩිය මැනව" යි ආරාධනා කර සිටියේය. එම ආරාධනාව ඉවසා වදාළ බැව් දැනගත් ගොපළු තෙමේ වැඳ අවසරගෙන බල්ලාත් සමගින් ආපසු නිවසට ගියේය. එතැන් පටන් බොහෝ දිනයන්හි ගොපළුතුමා බල්ලාට කථාකර පුතා ගිහින් ස්වාමීන් වහන්සේ වඩම්මවා එන්නයි කී සැනින් විහාරයට ගොස් තමා ආරාධනාවට පැමිණි බැව් දැන්වීමට තුන් වාරයක් ශබ්ද නගා බුරා පසේ බුදුන් වහන්සේ වැඩ වසන විහාරයේ දොරකඩට වී බලා සිටින්නේ ය. දානය සඳහා වේලාව පැමිණි කල්හි පා සිවුරු පාත්‍ර දරා වඩින්නේය. බල්ලා ස්වාමීන් වහන්සේට ඉදිරියෙන් ගමන් කරමින් මග දෙපස සිටින අනතුරු සතුන් එළවමින් මාර්ගය ආරක්‍ෂා කරදෙමින් යන්නේය. මෙසේ යන අතර එක් දවසක් බල්ලාගේ ක්‍රියා කලාපය බලාගැනීම පිණිස ගමන් කරන මාර්ගයෙන් වෙනත් මගකට පිවිසිසේක. එවිට බල්ලා ඉදිරියට ගොස් ඒ මඟ අවහිර කර යායුතු මාර්ගයට නැවත අවතීර්ණ විය. මෙයාකාරයට වෙනත් උපක්‍රම කලත් පසේ බුදුරජාණන් වහන්සේට තිබෙන අසීමිත සෙනෙහස නිසා යෑම ඒම දෙකේදීම දැඩි සෝදිසියෙන් යුතුවම රැක බලා ගත්තේය.

මෙසේ කල්යාමේදී පසේ බුදුන් වහන්සේගේ සිවුර බොහෝ සෙයින් දිරායන තත්ත්වයට පත්වූ කල ගොපළු තෙමෙ අලුත් සිවුරක් සඳහා සළු පිළි පුජා කලේය. එවිට පසේ බුදුන් වහන්සේ ගොපළු තෙමෙ අමතා "උපාසකය, තනිවම සිවුරක් සකස් කරගත නොහැකි නිසා පහසු ස්ථානයක් සහායට වෙනත් අය සිටින ස්ථානයක් වෙත යායුතුය" යි වදාළ පසු "එසේ නම් ස්වාමිනි, සිවුර සකස් කරගෙන අප කෙරෙහි අනුකම්පාවෙන් අප්‍රමාදව ආපසු වඩින සේක්වා" යි අයැද සිටියේය. ඉන්පසු අහසට නැග ගන්ධමාන පර්වතය බලා නික්මුණු සේක.

මේ අතර දෙදෙනාගේම කථාව අසා සිටි බලුතෙමෙ පසේබුදුන් වහන්සේ වඩින බැව් තේරුම් ගෙන කනස්සල්ලෙන් සිටියදී නොපෙනෙන දුර යනතෙක්ම බලාසිට ශෝකයෙන් ළය පැලී මැරී තමා විසින් කරන ලද වෙන කිසිම කුසලයක් නොමැතිවත් තිරිසන් සතුන් මිනිසුන් මෙන් නොව අවංක සෙනෙහෙවන්තයින් නිසා එතෙක් පසේබුදුන් වහන්සේට කරන ලද ගෞරවාන්විත කුසල බලයෙන් තව්තිසා දෙව්ලොව දිව්‍යාගනාවන් දහස් ගණන් පිරිවරාගත් මහේශාක්‍ය දිව්‍ය පුත්‍රයෙකු වී ඉපදුනි. බුද්ධිමත් මනුෂ්‍යයින් විසින් සිතට ගතයුතු ආදර්ශය වන්නේ තිරිසන් සතුන්ගේ මළකුණු අනුභවය වෙනුවට ඔවුන්ට කරුණාව, මෛත්‍රිය ඉපදවීමයි. එසේ උපන්නාවූ එම දිව්‍ය පුත්‍රයා ඉතා සෙමෙන් යමක් කියන කල්හි එම ශබ්දය දොළොස් යොදුනක් ඈතටද, ශබ්ද නගා යමක් කියන කල්හි සියලූ තව්තිසා දිව්‍ය ලෝකයෙහි දසදහසක් යොදුන් පුරා ඇසෙයි. එසේ වූයේ තමා බල්ලකු වී ඉපිද සිටියදී පසේ බුදුරජාණන් වහන්සේට ආරක්ෂාව පිණිසත් දානයට ආරාධනාව පිණිසත් මහත් ගෞරවයෙන් යුතුව කළ ශබ්දය නිසාය. එනිසා තව්තිසා දෙවියන් ඔහුට "**ඝෝෂක**" දිව්‍ය පුත්‍රයායි නම් තැබූහ.

මෙසේ අපමණ දිව්‍ය සම්පත් විඳිමින් සිට කාලයාගේ ඇවෑමෙන් ආයු ගෙවීමෙන් චුතවීමේ අවස්ථාව උදාවිය. දිව්‍ය ලෝකවල උත්පත්ති ලබන්නාවූ දෙවියන්ගේ චුතවීමට (මරණය) හේතු කාරණා හතරක් උදාවන්නේය. එය මෙසේය. **ආයුෂ ගෙවීමෙන්, කුසල් බලය අහෝසි වීමෙන්, ආහාර නැතිවීමෙන්, කෝපය හටගැනීමෙන්** මෙකී සතර ආකාරයෙන් මරණයට පත්වන්නේය. එයද මෙසේය.

1. මිනිසාගේ පරමායුෂ මෙන් එකී එකී දිව්‍ය ලෝකවල තිබෙන ආයුෂ ප්‍රමාණය අවසන් වීමෙන්ද,

2. සතර අපායන්වල අකුසල කර්මවිපාක ගෙවා අවසානයේදී ඉතිරිවන කුසල් විපාක සඳහා දෙව්ලොව ඉපදීම, බ්‍රහ්ම ලෝකවල ආයුෂ අවසන්ව දිව්‍ය ලෝකවල ඉපදීම, මිනිසත් ආත්ම භවයන්හිදී කරගත් කුසල් බලයන් මත ඉපදීම එම කුසල්වල බල ප්‍රබල තත්ත්වය අනුව එහි සිටීමට හැකි කාල වකවානුව

3. ආහාර ක්ෂය වීම නම් සදිව්‍ය ලෝකවල තිබෙන අසීමිත දිව්‍ය සම්පත් වලට කෑදර කමෙන් ඒවායෙ සැප සම්පත් විඳින අවස්ථාවේදී ආහාර ගැන සිහියක් එන්නේ නැත. එම හේතුවෙන් ආහාර ගත යුතු වේලාවට ආහාර නැති නිසා කලාන්තව චුතවන්නේය.

4. එක දිව්‍ය පුත්‍රයෙකුට කෙනෙක් දෙවන නොවන ආකාරයට මනුලොව දී කරගත් කුසල් බලයෙන් මහේශාක්‍ය දෙවියන්ගේ දිව්‍ය බලය බලා සිටීමට නොහැකිව ඊර්ෂ්‍යාව හටගන්නේය. එහි අනිටු විපාක වශයෙන් ආයු පිරිහී අකාලයේ චුත භාවයට පත්වන්නේය.

මෙම ඝෝෂක දිව්‍ය පුත්‍රයාද දෙව්ලොවින් චුත වී කොසැඹෑ නුවර ගණිකාවකගේ කුසතුල පිළිසිඳ ගත්හ. මෙසේ දසමාසයක් ගියකල ඇය පුතකු බිහිකලහ. ඉන්පසු ඇය සේවිකාවියකු ගෙන්වා මම බිහිකලේ කෙල්ලක්ද? කොල්ලක්දැයි විමසා කොල්ලෙක් බව දන්වා සිටිපසු එසේනම් රෙදිපාළුකඩවල ඔතා කසල ගොඩකට ගිහින් දමන්නැයි කීවේය. වෛශ්‍යාවන්ගේ සිරිතක් වන්නේ පිරිමි දරුවකු බිහිකලොත් පොදු කසල ගොඩකට දැමීමයි. ගැහැණු දරුවකු බිහිකළොත් තම පරපුර ගෙනයාම සඳහා පෝෂණය කර හදා වඩා ගැනීමයි. ඒ අනුව මෙම දරුවාද පොදු කසල ගොඩකට ගෙන ගොස් දමන ලදි. කසල ගොඩේ පෙට්ටියෙ සිටින දරුවා වටා බල්ලන්, කපුටන් එක්රොක්වන්ට විය. පෙර බලූ ආත්මයෙ ඉපිද පසේ බුදුරජාණන් වහන්සේට වනසතුන්ගෙන් වන උපද්‍රව වැලැක්වීම පිණිස කරනලද බිරීමේ ආනිසංස බලයෙන් එකද සතෙකුගෙන්වත් සිරිම් මාත්‍රයකද තරම් අනතුරක් නොවීය.

එම ස්ථානයෙන් යමින් සිටි එක් මනුෂ්‍යයෙක් මෙම දරුවා දැක දරු සෙනෙහස උපදවා තම නිවසට ගෙන ගියේය. එසමයෙහි කොසැඹෑ නුවර සිටානෝ රාජ්‍ය සේවයට යන්නාහු රජගෙයි සිට තම නිවසට එන්නාවූ පුරෝහිත බ්‍රාහ්මණයා දැක "ආචාරීන් වහන්ස, අද නැකැත් පරීක්ෂා කලා" දැයි අසා පරීක්ෂා කරබැව් පැවසූ පසු අද තිබෙන

විශේෂය කුමක්දැයි ඇසුවේය. එවිට ආචාරීන් වහන්සේ පවසන්නේ "අද මෙනුවර උපන් කුමාරයෙක් වෙත්නම් ඔහු මහා ධන සම්පත් හිමි සිටාණෝ කෙනෙක් වන්නේය." යි පැවසීය. ඒ ඇසූ සිටාණෝ තම බිරිඳද දරුවකු බිහිකිරීමට ආසන්නව සිටි නිසා තම අතවැසියකු නිවසට යවා සිටු බිරිඳ දරුවකු බිහිකලාද? යි නැද්ද? යි දැන ඒමට යවා ඒ වනවිට දරුවකු බිහිකල නොමැති බැව් පැවසුවේය. ඉන්පසු රජගෙට ගොස් රජතුමා බැහැදැක වහා නිවසට පැමිණ නිවසේ සේවයේ යෙදී සිටින "කාලි" නම් සේවිකාවක කැඳවා මසු දහසක් දී මෙනුවර පරීක්ෂා කර අද උපන් පිරිමි දරුවකු ඇත්නම් මෙම මසු දහස දී එම දරුවා රැගෙන එවයි කියා යැවීය. එකී සේවිකාවද නුවර ඇවිදින අතර කසල ගොඩේ තිබී රැගෙන ගිය දරුවා සිටි නිවස දැන එහි ගොස් විස්තර දැන එම මුදල ගෙවා දරුවා රැගෙන පැමිණියේය.

දරුවා ලත් සිටාණෝ මෙසේ සිතිය. මගේ බිරිඳ දුවකු ප්‍රසූත කළහොත් මොහුට පාවාදී ආරක්ෂා කරමි. පුතකු බිහි කළහොත් මොහු නිවසින් පිටකරමි යි සිතා සිටියදී තම බිරිඳද පුතකු බිහි කලහ. එවිට සිටාණෝ සිතන්නේ මොහු සිටියොත් මගේ පුතාට සිටු තනතුර නොලැබෙයි එම නිසා දැන්මම මොහු මරා දැමිය යුතු යැයි සිතා තම කාලි නම් සේවිකාව කැඳවා මේකාගෙන ගොස් ගවගාලේ හරකුන් පිටකරන වෙලාව බලා උන්පිටවන දොරකඩ දමා ගවයින්ට පෑගී මැරුණු බව හෝ ජිවත්ව සිටින බව හෝ දැනගෙන එවයි කීහ. ඇයද සිටාණෝ කී ආකාරයටම දරුවා බිම දමා ගවයන්ට පෑගී මැරේදෝයි පරීක්ෂාවෙන් සැඟව බලාසිට ගවරැල එළියට එන වෙලාවට වෙනදා පසුවටම එන මහ ගවයා එදින පළමු කොටම පැමිණ දරුවකු සිටිනු දැක දරුවාගේ ආරක්ෂාව පිණිස කකුල් හතරට මැදිකොට අනෙක් ගවයන් පිටවනතෙක් එහි සිටිනු දුටු ගවහිමියා අසලට ගොස් බැලීමේදී සුරතල් දරුවෙකු සිටිනු දැක දරු සෙනෙහසින් වඩාගෙන නිවසට ගෙන ගියහ.

ඒ බැව් සේවිකාව ගොස් සිටාණන්ට කීහ. ඒ අනුව නැවත මසු දහසක් දී දරුවා ආපසු ලබාගෙන නැවත එම කෙල්ලට කියන්නාහු "හෙට පාන්දර මෙනුවරින් ගැල් පන්සියයක් බඩු පටවාගෙන වෙළඳාමට යන පිරිසක් පිටත්වෙති. තෙපි එම ගැල් එන මඟෙහි කිසිවෙකුට නොපෙනෙන ලෙස එම ගැල්වලට යටවී මැරියන ආකාරයට දරුවා තබා සැඟව බලාසිට වෙන දෙයක් මට කියව" යි කියා නැවත යැවීය. කාලි නම් එම සේවිකාවද කියපු ආකාරයටම සැඟවී බලා සිටියහ.

ගැල් නායකයා මුලිකව නික්මුණාහ. එසේ නික්ම කුමාරයන් සිටි අසල මුල්ගැලෙහි යොදන ලද එකම ගොනෙකුවත් කුමරුවා අසලට නොපැමිණ සිටිවනම සිටියා ය. ගැල්හිමියන් කොතෙක් උත්සහ කළත් එකද ගොනෙකුවත් මෙහෙයවන්ට බැරිවිය. ඒ අතර අරුණෝදයද උදාවිය. ගැල් නායකතුමා අවට පරීක්ෂා කර බැලිමේදී මාර්ගය මැද කුඩා දරුවෙකු සිටිනු දැක මහත් දරු සෙනෙහසින් තම නිවසට ගෙන ගියේය. එම සිද්ධියද සිටුතුමාට දැන්වූ පසු නැවත මසු දහසක් දී දරුවා ආපසු ලබාගෙන නැවත කාළි නම් සේවිකාව ලවා සොහොන් පිටියක් අසල කොළරොඩු අතර තබා වෙන දේ බලා මට දන්වන්නැයි කියා යැවීය.

එකී ආකාරයටම සොහොනටම ගොස් දරුවා එහි තබා පසෙකට වී බලා සිටියේය. පෙර ආත්මයේ මෙම දරුවා මෙම කථා වස්තුවේ මුලින්ම සඳහන් කල පියා විසින් දරුණු දුර්භික්ෂයෙන් මිදීම සඳහා අජිත නම් රටේ සිට කොසැඹෑ නුවරට එන අතරතුරේ දරුවා අතරමං කර යාමට ගත් සිතිවිල්ලත්, ක්‍රියාකලාපයෙත් අනිටු විපාකයි. හිතා මතා අනතුරක් නොකරපු නිසා මෙවැනි උපක්‍රමවලින් මරන්ට උත්සහ කළත් බලු ආත්මයේ ඉපිද පසේ බුදුරජාණන් වහන්සේට කරන ලද ආරක්ෂාවේ පුණ්‍ය බලය නිසා ඒ සෑම තැනකම මරණය වෙනුවට සීරීම් තරමකවත් අනතුරක් ද නොවී සෑම කෙනෙක්ම දරු සෙනෙහසින් භාරගත් ආකාරයටම මෙම අමුසොහොනිදු කිසිම උපද්‍රවයක් නොමැතිව සිටින අතර එක් එළු ගොපල්ලෙක් එම ස්ථානයෙන් තමන්ගේ එළුවන් රැන ගෙන යමින් සිටියදී, එක් එළු දෙනක් කොළ අතු කකා යමින් සිටියදී මේ දරුවා දැක උපන්නාවූ බලවත් දරු සෙනෙහසින් ළඟට ගොස් දෙදන බිම තබා කිරිපොවන්නට ගත්හ.

අනෙක් එළුවන් ඉදිරියට යතත් එම එළුදෙන නොයන නිසා කෙවිටගෙන ළඟට පැමිණි විට එළුදෙනගේ ක්‍රියාකලාපය දැක මහත් දරු සෙනෙහස උපදවා කිරිපොවා අවසන් වනතුරු බලාසිට සෙනෙහස උපදවා වඩාගෙන ගෙදරට ගියහ. එම සිද්ධියද සේවිකාව සිටාණන්ට කිව්වේය. මු නම් එසේ මෙසේ එකෙක් නම් නෙවෙයි මොන ආකාරයකින්වත් මුගෙන් නිදහස් වෙන්න ලැබෙන්නේ නැතැයි සිතා නැවත මසු දහසක් දී ආපසු ගෙන එකී කෙල්ල ලවාම පර්වතයක් මුදුනක සිට පහතට දමන ලෙස උපදෙස් දී යැවීය. තම හාම්පුතාගෙ අණ අකුරටම ඉටුකරන කාළි නම සේවිකාවද කියපු අකාරයටම කඳුමුදුනින් පහතට දරුවා දැම්මේය. පින්බලයේ මහිමයෙන් එම කඳු ශිඛරය ආශ්‍රිතව

වැඩුණු උණපඳුරක් වසා ඝනයට වැවී තිබුණු ඔළිඳවැල් ගාලක් නිසා ඒ මතුපිටම දරුවා වැටී තොටිල්ලක් මත සිටින දරුවකු සේ එහි නිරුපද්‍රිතව සිටියහ. ඒ අතර එක් මනුෂ්‍යයෙක් තම පුතුද සමඟ උණගස් අවශ්‍යතාවයකට කපාගැනීම පිණිස ගොස් එම ගස්කැපීමේදී වූ ගැස්සීම් ශබ්ද නිසා දරුවා නින්දෙන් අවදි වී හඬන්නට ගත්තේය. එම දරුවාගේ ඇඬීමේ ශබ්දය ඇසුණු එම පියපුතු දෙදෙනා දරුවා සිටින පෙදෙස දැන වෙනත් මඟකින් උඩට නැග මහත් දරු සෙනෙහසින් තම නිවසට ගෙන ගියහ. එයද බලාසිටි සේවිකාව සිටාණන්ට වූ සිද්ධිය කීවේය.

ඔළුවේ දෑත් ගසාගත් සිටාණෝ තවත් කහවනු දහසක් යවා දරුවා නැවත ආපසු ගෙන්වාගෙන ඉක්මනින්ම මෙම කරදරයෙහි මිදෙන්න මඟක් ගැන සිතමින් සිටිනාතුර දරුවා ක්‍රම ක්‍රමයෙන් වැඩෙන්නට ද විය. ඒ අතර දරුවාට "**ඝෝෂක**" කුමරු යයි නම් තැබීය. මෙසේ සිටින අතර එක් කුඹල් කරුවෙකු සිටු මැදුරට පැමිණි කල "නැවත වළන් පුළුස්සන්නේ කවදා" දැයි විමසූ විට "එසේ නම් මාගේ එක් කටයුත්තක් කිරීමට තිබෙනවා මේ මසුදහස තොපට නිකම් දෙන දෙයක් එම වැඩේ නිමවූ පසු තොපට කරන උපකාරයක වෙනම මම කරමි. මාගේ එක් අවලක්ෂණ වධකාර දරුවෙක් ඉන්නවා, ඌ තොප කරා මම එවූ පසු කෑලි කෑලිවලට කපා හැළියක දමා පෝරණුව ඇතුළට දමා ගිනි තබව" යි කීවේය. කුඹලාද එය ඉස්මුදුනෙන් පිළිගෙන "ඔබ වහන්සේ කියන ආකාරයටම මම එය ඉෂ්ඨ කරමි" යි කීවේය.

ඒ අනුව පසුදින සිටාණෝ ඝෝෂක කුමරු කැඳවා මම ඊයේ කුඹලාට එක් කටයුත්තක් භාර කළෙමි. එම කටයුත්ත නිහඬ කරන්නැයි කුඹලාට කියන්නැයි කියා යැවීය. එවිට කිසිවක් නොදැන කුඹල්ගෙට යන ඝෝෂක කුමරු දැක සිටාණන්ගේ ජාතක පුතු වෙනත් ළමයින් සමඟ තරගයට කරන ක්‍රීඩාවකින් පරාජයට පත්ව ඝෝෂක කුමරුන් වෙත පැමිණ කොහි යන්නේ දැයි ඇසූ පසු "පියාණන් වහන්සේ භාරදුන් පණිවිඩයක් කුඹල්කරුට දන්වන්නට යන්නෙමි" යි කී පසු "එම පණිවිඩය මම ගිහින් කියා එන්නම් එතෙක් මා පැරදී සිටින නිසා මා වෙනුවෙන් ක්‍රීඩා කරන්නෙ"යි අයැද සිටියේය. එවිට ඝෝෂක කුමරුවෝ කියන්නාහු "මම පියාණන් වහන්සේට බයයි මට කී වැඩේට ඔබ යැව්වා යි කියා මට කිපෙයි ඒ නිසා මමම ගොස් කී පණිවිඩය කර එන්නම්" කී පසු "අයියා බය නොවන්න ඔබට කී ආකාරයටම මම එය කරගෙන එන්නම් මම ආපසු එනතෙක් මා වෙනුවෙන් තරඟ කර

දිනන්න"නැයි නැවති කියා සිටි පසු ඝෝෂක කුමරු එයට එකඟව තරඟ කරන්නත් සිටාණන්ගේ පුතා කුඹල්කරු වෙත යන්ටත් වූහ.

එසේ කුඹල්කරු වෙත ගිය බාල කුමරු කුඹලාට මෙසේ කීවේය. "අපගේ පියාණන් වහන්සේ ඊයෙ දවසේ නුඹට එක් කටයුත්තක් කිවේය. එය වහා පිරිමස්වාලුව මැනව" යි කීවේය. ඉන්පසු කුඹලාද සිටාණන් කී ලෙසම ඒ කුමරු මරා කැලි කපා මුට්ටියක දමා පෝරණුවෙහි දැමීය. ඝෝෂක කුමරුද අඳුරු වැටෙනතෙක් බාල කුමරුන්ගේ පැමිණීම නැති නිසා නිවසට ගියපසු සිටාණෝ මවිතයට පත්ව "ඇයි පුතා ගිය ගමන නොගියේ" කියා ඇසූ තැනේදී "මගේ ගමන වලක්වා මල්ලි එම කුඹල්ගෙට ගියා" බැව් පැවසූ පසු සිටාණන්ගේ ඇඟ ගිනියම් වී දාඩිය දමා මට වෙච්ච විපතක් යයි කියව කියවා අඬන්නට ගත්තේය. "එම්බල කුම්භකාරය මා නොනසවා" යි කියමින් දෑත හිස මුදුනෙහි තබා විලාප දිදී කුඹල්කරුවා වෙත දිව ගියේය. එය දුටු කුඹල්කරු "ස්වාමිනි, කණගාටු නොවන්න ඔබ වහන්සේ කී ආකාරයටම වැඩේ කළා" කී කල තමා විසින්ම කී වැඩක් නිසා කිසිත් කරකියාගත නොහැකිව දුකෙන් වෙවුල වෙවුලා ආපසු ඇවිත් දරුවාට වූ විපත වෙනුවෙන් මහත් අසහනයට පත්ව පශ්චාත්තාපය ජිවිතය පුරාවටම ඉතිරිකර ගත්තේය.

මෙසේ නොයෙක් ආකාරයෙන් කුමාරයන්ගේ භාග්‍ය නිශ්චය වුවද සිටාණෝ කුමාරයන්ගෙ මුහුණවත් නොබලා කවර උපායකින් මූ මරන්නේදැයි තව තවත් වෛරයෙන්ම දැවි දැවී කාලය ගෙවන්නේය. එසේ සිටින අතර කුමරුගේ භාග්‍යයටද, සිටාණන්ගේ පශ්චාත්තාපයටද හේතු කාරණාවූ සිතක් පහළ විය. එය මෙසේයි "සිටාණන්ගේ ගම් සියයකට අධිපති ගම්මුලාදෑනියා වෙත යවා ඔහු ලවා මරවමි" යි සිතා ලිපියක් මගින් මෙසේ දැන්විය. "මේ මාගේ අවාසනාවන්ත පුතා මරා වළදා මට දන්වන්න එවිට ඒ වෙනුවෙන් නුඹට මාගෙන් වියයුතු යුතුකම මම දනිමි" යි කියා පතක ලියා පෙර කුඹල්කරු වෙත යවපු ආකාරයටම ඒ කුමරු අතර එම පත යවන ලදි. කුමරුද අකුරු නොදන්නාකම නිසා ඒ කුමරුගේ මරණ වරෙන්තුව කුමරුම ගෙන යාමට පෙර, "මාපියාණන් වහන්ස මේසා දුරක් යාමේදී මට මඟදී කෑමට බත් ගෙන යායුතු නේද?" යි ඇසූවිට සිටාණෝ සැබෑ දරු සෙනෙහසක් මවාපාමින් "පුත, තොප යන මඟ අසවල්ගම අපගේ මිතුරු සිටාණෝ කෙනෙක් ඇත ඔහුගෙ ගෙට ගොස් මාගේ නම කියව එවිට තොපට කලමනා සත්කාරද බත්ද ලැබේ" යයි කියා යැවීය.

මෙසේ ගොස් සිටාණන්ගේ ගමට වැද, එම සිටු නිවස සොයා ගියපසු එම සිටුතුමාගෙ බිරිඳට තමා පැමිණි කාරි විස්තර කී පසු එතුමිය දරු සෙනෙහස උපදවා පිළිගත්හ. එම සිටු නිවසේ බොහෝ සේ සැප සම්පත් විඳිමින් සත්මහල් ප්‍රාසාදයේ මතුමහල් තලයෙහි සිටින එකම දරු සම්පත වූ දහසය හැවිරිදි සිටු දියණියගේ මෙහෙවර කරන කෙල්ලක් කිසියම් කටයුත්තක් සඳහා කඩ වීදියට යනු දුටු සිටු බිරිඳ ඇය කැඳවා "මේ දරුවාගේ මුහුණ කට සෝදවා තෙල් ගා සැතපීමට යහනාවක් දෙවා ති ආ කටයුත්ත කරගෙන යව" යි කී පසු එකී කටයුතු නිමකර ප්‍රමාදව සිටු දියණිය වෙත ගියපසු ඇයගේ දෝෂාරෝපණයට ලක්වූ පසු ඇය සියලු පුවත් කිය. එම විස්තර සමඟ ඝෝෂක යන නම ඇසූ පමණින්ම ඇයට මහත් ආදර ස්වාමි භක්තියක් ඇතිවිය.

එසේ වූයේ ඇයගේ පෙර දෙවන ආත්ම භාවයෙ එනම් "කොතුහල" නමින් සිටි අජිත නම් ගමේ සිට කොසැඹෑ නුවරට එන ගමණේදී ගොපළු නිවසේදී මියගිය ස්වාමියා වීමයි. ඇය මෙතරම් භාග්‍ය සම්පන්න සිටුකුලයක ඉපදුනේ එම ආත්ම භාවයේදී ගොපළු නිවසේ බැළමෙහෙකර උපයාගත් වස්තුව ලෝභ සිතක් නැතිව මහත් ශ්‍රද්ධා භක්තියෙන් යුතුව පසේ බුදුරජාණන් වහන්සේට දන්දුන් කුසල බලය නිසාය. කොතුහලට මෙන් මාරක බාධක පීඩා නොවූයේ කොපමණ දරුණු සිතක් ඇති මිනිසෙක් වුවත් තම දරුවාට කරපු වෙනස්කම් නිසාවත් ස්වාමි භක්තිය හීනනොකර ගත් නිසාත්, දුර්භික්ෂ ගමනේදීත් කොපමණ අපහසුවෙන් නමුත් නියම මව් සෙනෙහසින් දරුවා ආරක්ෂා කරගත් නිසාත් එතුමියට එවන් අතුරු දුක් කරදර වලට පත්වීමට නොවීය. කොතුහල නම් මිනිසාගේ තිබුණු ආත්මාර්ථකාමීත්වයත් තම දරුවා වෙනුවෙන් සිතූ කෙරූ කෲරකම්වල විපාක වශයෙන් බලූ ආත්මයේ වෙසගණක් කුසතුළ ඉපදීමත් පියකු වශයෙන් භාරගත් අයගෙන් විඳීමට වූ ගැහැටත් එකී දරුවාට කරපු වෙනස්කම් වල අතුරු විපාකයි.

කෙසේ නමුත් බුදු, පසේ බුදු, මහරහතන් උතුමන්ලාද, බුද්ධ ශාසනයක් තුල වැඩ සිටින පින් කෙත වූ මහා සංඝ රත්නය හෝ හේතු කොට ගෙන තිරිසන් ආත්ම භාවයන්හි ඉපිදත් පව යටපත් කර පින මතුකර දීම වශයෙන් සියළු බාධා මැඩ ගෙන මෙලොව පරලොව සැපතක්ම උදාවන්නේය මේ සඳහා අපගේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"පුබ්බෙව සනනිවාසෙන පච්චුප්පන්නහිතෙනවා
එවංතං ජායතේ පේමං උප්පලංබ යථොදකේ ති"

එහි අර්ථය :-

"දියෙහි හටගන්නා ඕලු, නෙළුම්, මානෙල් ආදිවූ පුෂ්ප ජාතිහු මඩ සහ දිය හේතුකොට ගෙන යම් සේ උපදිත්ද, එපරිද්දෙන්ම සත්වයන්ට ඔවුනොවුන් කෙරෙහි උපන්නාවූ ප්‍රේමයද පූර්වසසන්නිවාසයක් හෝ මෙම ජාතියෙහි කරන ලද උපකාරයක් හෝ හේතුකොට ගෙන උපදනේය" යි වදාළ සේක.

ඉන්පසු එම සිටු දියණිය "දැන් ඒ ඝෝෂක කුමරු කොයි"දැයි ඇසූකල "ඇඳමත නිදියි" කී කල "ඔහු ළඟ යමක් තිබේද"දැයි විමසුවේය. මොකක්දෝ පතක් වැනි යමක් හැර වෙන කිසිවක් නැතැයි කී පසු බුදුරජාණන් වහන්සේ වදාළ "ස්වකීය, කර්මයම දායාදකොට ඇත්තේය." යන බුද්ධ දේශනාව අනුව දෙමාපියන්ගේ ප්‍රමාදයක් බලා මතු මහල් තලයෙන් පහතට බැස ඒ කුමරු නිදියන තැනට අවුත් ඔහුට නොදැනෙන සේ ළඟ තිබූ පත රැගෙන තමන් වසන මතුමහල් තලයට ගොස් දොරවසා සී මැද කවුළුව විවෘත කොට තමා අකුරු දන්නා නිසා ලිපිය කියවන්නට ගත්හ. එම ලිපිය කියවීමත් සමඟ ඇයගේ ඇඟ ලේ වතුර බවට පත් වෙමින් අනේ අපෝ තමාගේ මරණ වරෙන්තුව තමාම ගෙනයන තරම් අකුරු නොදත් දරුවන්ද දුෂ්ඨ පියවරුන්ද සිටින ලෝකයක නේද? අප ජීවත් වන්නේ යයි සිතා ගත්හ.

"මම නොසිටින්න මොහුට වන විනාශය" යි සිතා විපත සැපතකට සාදාගත් ආකාරය මෙසේයි.

එම පත ඉරා දමා සිටාණන් එව් පතක් මෙන් වෙනත් පතක් මෙසේ සකස් කළේය. "අපගේ ගම්සියයෙහි පාලක ගම්මුළාදෑනිටයි. මාගේ එකම පුත්‍ර රත්නය වූ ඝෝෂක කුමාරයන් ඔබ වෙත එවමි. ඔබ අයත් ගම් සියයේ බදු අයකරගෙන ජනපදවාසී වූ අපගේ යහළු සිටාණන්ගේ දියණිය ඔහුට විවාහ මඟුල් කොට පාවාදී ගම්මැද දෙමහල් පායක් කරවා වාසල් පවුරු පදනමින් සහ මිනිසුන්ගෙන් මනා රැකවල් තබා ගෙවදනා මඟුල් කොට එම තමන් කරවූ සියල්ලම

අපට දන්වා එවූ කල එයට සරිලන ප්‍රසාද දීමට සූදානම්" යයි ලියමනක ලියා පෙර තිබූ ආකාරයටම කොපුවෙහි දමා කිසිවෙකුට නොදැනෙන ලෙස කුමරු අත තැබීය.

ඝෝෂක කුමාරයෝද නිදා පිබිද බත් කා එදින එහිම වැද පසුදා පාන්දරම ගම්මුලාදෑනි සොයා ගොස් එතුමාට එම පත පිළිගැන්විය. එතුමා එය කියවා බලා මහත් සතුටට පත්ව අපගේ සිටුතුමා මා වෙත මහත් වගකීමක් සහ එතුමාගේ වැඩිමල් පුතගේ විවාහ කටයුතු ආදිය මා වෙත පවරා එවා තිබෙන්නේ ය යි මහත් සතුටට පත්ව එම ලිපියෙහි සඳහන් අන්දමටම කටයුතු සූදානම් කරන්නට විය. ගම් සියයෙන් ලී දඬු ආදිය ගෙන්වාගෙන වහ වහා ගම්මැද දෙමහල් පායක් කරවා මිතුරු සිටුතුමාගේ දියණියද මහත් උත්සවශ්‍රීයෙන් විවාහ කරදී එහි පදිංචි කරවා එපවත් ඝෝෂක කුමරුගේ පියාණන්ට දන්වා යැවීය.

සිටාණෝ එපවත් අසා තම පුතාට අත්වූ ඉරණමත් ඝෝෂක කුමරුට අත්වූ ඉරණමත් සිහිපත් වී බලවත් අසාධ්‍ය තත්ත්වයට පත්ව අතිසාර රෝගය වැළඳුණේය. මේ අතර ඝෝෂක කුමරුගේ බිරිඳ සිටුතුමාගෙන් පතක් ලැබුණොත් මට දන්වා මිස කුමරුන්ට නොදෙන්නැයි දන්වා සිටියේය. සිටාණෝද "මේ අතර මාගේ සම්පත් මේ දුෂ්ඨයාට අයිතිවෙන්ට නොදෙමි" යි සිතා තමාගේ සේවකයකු කැඳවා "මපුතණුවන් ඝෝෂක කුමරු දකින්නට කැමැත්තෙමි, වහා ඔහු මා වෙත ගෙන්වා දෙන්න"නැයි දන්වා සිටියේය. ඔහුද පතක් ලියා වෙනත් සේවකයකු අත ඝෝෂක කුමරු වෙත යැවීය. ඔහු ගොස් ඝෝෂක කුමරුගේ නිවස ඉදිරිපිට සිටිනු දුටු සිටු දුවනිය ළඟට කැඳවා විචාල කල සිටුතුමා අසනීපෙන් සිටින නිසා කුමරුට වහාම එන ලෙස දන්වන්නැයි කී පසු ඔහුගේ තත්ත්වය අසා ඒ අනුව මැරෙන්න තව කල් තිබෙන බව දැන ලිපිය ගෙනා මිනිසාට ආහාර පානාදියෙන් සංග්‍රහකොට ආපසු යාම ප්‍රමාද කිරීමට සුවපහසු නිවසක් දී කැමැත්තෙන්ම නතරවන ආකාරයට සැලැස්වීය. ඔහු ආපසු නොපැමිණි නිසා දෙවන වරද දූතයෙකු යැවීය. එම පතද සඟවා තබා විස්තර අසා තවත් මැරෙන්න කල් තිබෙන නිසා පෙර මෙන් සංග්‍රහකොට ඔහුටද සුවපහසු නිවසක් සපයා දුනි.

මේ අතර සිටාණන්ගේ තත්ත්වය බරපතල විය. එක භාජනයක් ඉවත් කිරීමට පෙර තව භාජනයක මළපහ කරන්නේය. අණාකර

සේවකයා කැඳවා පණිවිඩ යැව්වේද? දැයි ඇසූ විට දෙදෙනෙකු දෙපාරකට යැවූබවත් ඔවුන් මේ දක්වා නොපැමිණි බැව් දැන් වූ පසු තවත් කෙනෙකු යවා මගේ අසනීපය අසාධ්‍ය බව පවසා වහාම කැඳවා එන්නැයි කියා යැවීය. ඔහුගෙන් දැනගත් තොරතුරු අනුව ඝෝෂක සිටු බිරිඳ දැන් යාමට අවස්ථාව සුදුසු යැයි තීරණය කර තම ස්වාමි ඝෝෂක කුමරු අමතා "ස්වාමීනි, ඔබගේ පියාණන් වහන්ස අසනීපවවයි දැනගන්නට ලැබුණි. ඒකට මොකද කරන්නේ" යි විමසීය. "අපි එසේ නම් අයගම් සියයෙ ආදායම් ගෙන යමු" යයි යෝජනා කළහ. ඒ අනුව පඬුරු එක්රැස් කරගෙන ගැල්වල පුරවා යාමට සූදානම් වූ විට සිටු දියණිය "ස්වාමීනි, මේවා ගැල්පුරවා යනවිට ප්‍රමාද වෙයි. පියාගේ තත්ත්වය අසාධ්‍යයි මේවා මෙහි තබා ඉක්මන්කර අස්රථ වලින් පිටත්වෙමු." යයි කී කල එසේම යාමට සූදානම් වූ කල නැවත සිටු දියණිය කියන්නේ "ස්වාමීනි, පියාණන්ගේ ගෙට ඇතුළු වූ පසු ඔබ පියාගේ දෙපා වැඳ පාමුල සිටින්න මම හිස ළඟ සිටින්නම්" කියා එයටද එකඟ කරවා ගෙන ගෙට ඇතුළු වන විට තමන්ගේ පිරිවරද උපක්‍රමයෙන් රැකවලට තබා ගත්තේය. කථාකර ගත් ආකාරයට දෙදෙනා දෙපස සිටගත් පසු සිටාණෝ උඩුකුරුව සිටියදි එක් සේවකයකු දෙපා පිරිමදිමින් සිට

"ස්වාමීනි, ඔබ වහන්සේගේ පුත්‍ර ඝෝෂක කුමාරයෝ මෙහි පැමිණ සිටිති" යි කීහ. කොයිදැයි විමසූ කල පාමුල යි කීහ. කුමාරයන් දුටු සැනින් භාණ්ඩාගාරික ගෙන්වා "මාගේ වත්කම් පවසන්න" කී පසු එතුමා වත්කම් වශයෙන් මෙපමණ මෙපමණ යයිද ධනරාශිය පමණක් හතලිස් කෙළක් යයිද කියනවාත් සමඟම සිටාණෝ "මම මෙතෙක් වස්තු ඝෝෂක කුමාරයන්ට නොදෙමි" යි කියාගෙන යාමේදී කුමාරයාගේ පිනේබලයෙන් "නොදෙමි" කියනු වෙනුවට "දෙමි" කියන වචනය කියවුණි. ඉස ඉද්දර සිටි කුමරිය මොහු නැවත වචනය වෙනස්කලොත් නපුරක් වේ යයි සිතා නැවත දොඩවන්නට ඉඩ නොතබා ඔහු කෙරේ දුකෙන් අඬන ආකාරයට කෙස්වැටිය කඩාගෙන මහත් ශබ්ද නගා "ස්වාමීනි, මේ මොනවා කියනවාද කියමින් සිටුතුමාගේ පපුවමත ඉස තබා අන් අයට නොදැනෙන ලෙස තද කරමින් විලාප දෙන්ට පටන් ගත්තේය. නැවත දෙවන වර මත වචනයක් පිටකිරීමට ඉඩ නොතබාම නුඹ වහන්සේගේ මෙබඳු වූ බස් අපගේ කනට වැටුණේ අප ඉතාම කාලකණ්නි" යයි සිතාද කියනවාත් සමඟම සිටාණෝ අවසන් හුස්ම හෙළිය.

උදේනි රජතුමා සිටුතුමා මළ නියාව අසා ආදාහන කටයුතු නිමකර සිටාණන්ගේ දරුවන් ඇද්ද? යි විමසූ පසු ඝෝෂක කුමරු නමින් පුතෙකු සිටින බව පැවසිය. එවිට භාණ්ඩාගාරික නිළමේ තුමා හුස්ම යන අවසන් මොහොතේ තම වස්තුව එකුමරුට පැවරුව බව පැවසිය. ඉන්පසු රජතුමා "ඝෝෂක කුමරු කැඳව" යි කියා පණිවිඩ යැවීය. එදින වැසි වැස රාජාංගනණයෙහි දිය පිරී තිබූ නිසා දියට නොබැස රජතුමා ඉදිරියට ගොස් වැඳ එකත් පස්ව සිටියේය. ඝෝෂක කියන්නේ තොපටද? යි ඇසූ කල්හි "එසේය, දේවයන් වහන්ස" යි පිළිතුරු දුන්හ. එවිට රජතුමා "එම්බා, සිටාණෝ මල යයි තොප ශෝක නොකරව, තොපගේ පියා සතු සියලු වස්තුව සහ එම තනතුර තොපට දෙමි" යි කීවේය. "දැන් තොප තොපගේ ගෙටම යව" යි සමු දුන්හ. ඉන්පසු සිටුකුමාරයා රජතුමාට වැඳ ආපසු යන්නේ රජතුමා වෙත ඒමේදී වැසි වතුර මඟ හැර ගියත් ආපසු යාමේදී ඒ මතින් යාමත් දුටු රජතුමා ඔහු නැවත කැඳවා "එම්බා දරුව, තොප පළමු මා වෙත ඒමේදී දිය පහර මඟහැර ඒමටත් ආපසු යාමේදී ඒ මතින් යාමත් කලෙ කුමන කාරණයක් නිසාද?" යි ඇසීය. "ස්වාමීනි, මම කලින් දිය මඟහැර පැනගෙන ආවේ මා කුඩා කොල්ලකු වැනි වගකීමක් නැති කෙනෙකු නිසාය. ඔබ වහන්සේ මාවෙත සිටුතනතුරත්, පියා සතු බූදලයත් මා වෙත පැවරීමේ වගකීම නිසා වගකිවයුතු පුද්ගලයෙකුගේ හැසිරීමේ ලීලාව අනුව ආපසු යාමේදී ජලය පාගාගෙන ගියෙමි. යි කීවේය."

එබස් ඇසූ රජතුමා මහත්සේ සතුටට පත්ව ඉතා ධෛර්‍යය සම්පන්න කරුණු කාරාණා දන්නා වූ තරුණයෙකි දැන් මම මොහුට සිටු තනතුර දිව යුතු යැයි සිතා පළමු සිටාණන් සතු ගම්, බිම්, ගව, ඇත්, අස් ආදියෙහි හිමිකරු භාවයද, රජතුමාගෙන් වෙන වෙනමද එකී එකී වස්තු දෙමින් සිටු පටබැඳවා රථයකින් නුවර පැදකුණු කොට ගෙට යැවීය. මේ අතර සිටු දියණියෝ මඟුල් වාහල කාළි නම් කෙල්ල සමඟ කථාකරමින් සිට "කාළි මෑණියනි, තොප පුතණුවන් මෙතෙක් සම්පත් ලද්දේ මා නිසාය" යි කීවේය. එතෙපුල් අසා කාළි දාසිය "ඊට කාරණා කිම" දැයි විචාරා මේ සිටාණෝ තමන් මරන්ට ලිපියක් කොපුවක බහාගෙන මාගේ දෙමව්පියන්ගෙ ගෙට ආවේය. එකල මම එම පත කියවා බලා අකුරු නොදන්න තමන් ගෙනයන්නේ තමාගේම මරණය ඉල්ලාගත් ලිපියක් නිසා එම ලිපිය ඉරාදමා එම උවමනා ආකාරයට වෙනත් පතක් ලියා ඔහු අත යැව්මි. ඒ අනුව ඔහු සමඟ සරණව එතැන් පටන් මේ දක්වාම ඔහු ආරක්‍ෂා කලා පමණක් නොව මෙම සියලු සම්පත්ද ඔහුට හිමිකර දුනි.

එවිට කාළි කියන්නේ "මැණියෙනි ඔබ දන්නේ එපමණයි, එපමණක් නොවෙයි මෙම සිටාණන් මෙතුමා කුඩා කල පටන්ම නොයෙක් වර නොයෙක් ආකාරයෙන් මරන්න උත්සහකරත් මරාගන්ට බැරිවිය. ඒ වෙනුවෙන් වියදම් වූ වස්තූද බොහෝය. තම එකම පුතාද දරුණු ලෙස අත්පා කප්පවා කුඹල්කරු ලවා මැරවූයෙත් පුතා මැරීමට නොව ඝෝෂක කුමරු මැරීමේ උවමනාවට" යි කීවේය. එපවත් අසා සිටු දියණියෝ "මැණියනි, ඒ සිටාණන් කරතිබෙන අපරාධ නොකර බැරි තරම්ය" යි කීහ. එම අවස්ථාවේදීම නුවර පැදකුණු කොට සිටුතුමාද එහි පැමිණ ගෙට ඇතුළුවන අවස්ථාවේ සිටුදියණිය ඔහු දෙස බලා "මෙතෙක් සම්පත් වරප්‍රසාද පමණක් නොව ජීවිතයද රැකුණේ මා නිසාය" යි සිතා සිනාසෙන්ට වූහ.

එවිට සිටාණෝ "දැන් තී සිනාසුන හේතුව කුමක්ද" යි අසා නොකියන නිසා කඩුව කොපුවෙන් ඇද "නොකියන්නේ නම් මෙතනම තී දෙපලු කරන්නෙමි" යි කීවේය. එවිට සිටු දියණිය කියන්නේ "මෙතෙක් සම්පත් මා නිසා ලැබුණු නිසා සිනාසුනෙමි" යි කීහ. පළමු තම පියාණන් තමන් මරන්ට කරපු ක්‍රියා කිසිවක් නොදත් නිසා "මාපියාණන් වහන්සේ, තමන් වහන්සේ සතු වස්තුව මට දුන් සේක. තෙපි මට කුමක් දුන්නේහිද?" යි කීහ. එවිට සිටු දියණිය කියන්නේ නුඹගේ පියා ඔබ මැරීමට පතක් දී ඔබ අතම එවූ අකාරයෙන් එම පත මම කියවා බලා ඔබ මරණයෙන් මුදාගත් ආකාරය කීවත් එය විශ්වාස නොකරන නිසා මා කියන්නක් විශ්වාස නොකරන්නේ නම් ඔබගේ කිරිමැණි කාළිගෙන් අසා දැනගන්නා මෙන් කීවේය.

එවිට කාළි කැඳවා "මැණියනි, මට සියලු විස්තර කියන්න" යැයි ඇයද සිටියේය. එවිට එම කාළි නම් සේවිකාව කුමරු කුඩාකල පටන්ම මරන්ට ගත් උත්සහයන් සියල්ල එකින් එක විස්තර කළේය. "මේ සිටුදියණිය නිසා තමයි ඔබ මරණයෙනුත් බේරී මෙකී සියළු සම්පත් වලිනුත් බලවත් වූයේ" යයි කීහ. ඉන්පසු සිටුතුමා මහත් කම්පාවටත්, මෙතෙක් මෙතෙක් උපක්‍රමවලින් මට අනතුරක් නොවී මේසා තත්ත්වයකට පැමිණියේ පෙර කුමක් හෝ මහා කුසල කර්මබලවේගයක් නිසායයි සිතා ඉන්පසු ධාර්මික සාධාරණ දිවි පෙවෙතකට බැස දන්දීමේ සිල් සමාදන් වීම් බොහෝ සේ කිරීමට වන්හ. එදා පටන් ස්වාමි බිරිඳට මවකට සේ සැලකුවේය.

...නිමි...

## සංස්කාරකගෙන්

පුස්තකාලවල සහ පුද්ගලික පොත් අල්මාරිවල දිර දිරා යන වේයන්, මීයන් කන ඉන්පසු ඉතිහාසය කුණු කූඩයට යන මෙවන් ධර්ම ග්‍රන්ථ අප සම්පාදනය කරනු ලබන්නේ මතු පරපුර වෙනත් අපේ වර්තමාන නාමික බෞද්ධයන්ට මේවා තුලින් යමකිසි පණිවිඩයක් දීම සඳහාය. එම නිසා මෙවන් පොත් මුද්‍රණය කර බෙදා හැරීම සඳහා කාගෙ කාගෙත් ආධාර උපකාර අවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

සංස්කරණය කරනු ලැබුවේ ක්‍රි. වර්ෂ 2009.07.11 වන දින ශ්‍රී ශෛලබිම්බාරාම භාවනාශ්‍රමය, කිවුලවාඩිය, ලග්ගල පල්ලෙවෙලදීය.

මීට, මෙතැති,

**අකුරේගොඩ රතනසාර හිමි**

තිස්සමහාරාමය,
කාවන්තිස්සගම,
ශ්‍රී ඤාණාරාමය

## සැදැහැයෙන් සසුන්ගත වන කුල දරුවන් නොමඟ යවන ගුරුවරු හා මවුපියෝ

සසර පුරුද්දකට හෝ මෙදා යම්කිසි පැහැදීමකට හෝ සසුන්ගත වීමට කුල දරුවෝ ඉදිරිපත් වෙති. මෙය ඒහි භික්ෂු මහණකමක් නොවේ.

සරණ සිල සමාදාන මහණකමකි. තෙරුවන් කෙරෙහි භක්තිය හා සිල් පද දහයක් ආරක්ෂා කිරීමේ පැවිද්දකි. උපසම්පන්න භික්ෂූන් වහන්සේට අයත් ශාසනික වරප්‍රසාද කිසිවක් මේ අයට නොමැත. හඳුන්වන්නේ භික්ෂු යන නමින් නොව සාමණේර යන නමිනි. මේ අය අනුගමනය කළ යුතු දින චරියාවක් ඇත. සමාදම් වෙන සිල්පද දහය පිරිහෙන කරුණුත් ඇත.

ඒවා දස පරිජි නමින් හැඳින්වෙයි. දින චරියාව දස පරිජි දසසිල් දස දඬුවම් මනාකොට ප්‍රගුණ කරවා සසුන්ගත කළ යුතු වෙයි. අවශ්‍ය සාමණේර බණ දහම් පිළිබඳ කිසිම පුහුණුවක් නොකර මහා උත්සවයක් සංවිධානය කොට සතර පේරුවේ දායක දායිකාවන්ට පැවිදිවෙන කුල දරුවන්ගේ සතර වර්ගයේම නෑයන්ට කියා පැවිදි පින්කම් සංවිධානය කරති. මේ මහණකමේ ඉතාම පිරිසිදු අවස්ථාවක්. මොනවා හරි පිරිකරක් පූජා කර ගත්තොත් මහනිශංසදායි මහා පින්කමක් ලෙසින් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැවිදි වූ සමාණේරයන් වැසී යන තරමට පිරිකර පූජා පවත්වයි.

ශත පහක්වත් වත්කමක් නොමැතිව සිටි ළමයා පැවිදිවීමෙන් පසු පිරිකර රාශියක අයිතිකාරයෙක් වෙයි. කෙස්ගස පවා අනිත්‍ය බව දුක් බව ඒ නිසාම මේ ජීවිත අනාත්ම බවට යොමුකරවා කහවත ඇන්දවූ වහාම ආශා පොදියක් ඒ ළදරු සාමණේර හදවතට බද්ධ කරයි.

උපසම්පන්න භික්ෂූන්ට සියලු වරප්‍රසාද ලබාදෙයි. පසළොස් දවසකට වරක් භික්ෂූන් වහන්සේලා පාමොක් දෙසිය යුතු අතර සාමණේරයන් වහන්සේ ද පසළොස් දවසකට වරක් සිල් සමාදන් විය යුතුවෙයි. එහෙත් සිල්පද දහය රැකීමේ උත්සහය සිල් අලුත් කිරීමේ පුරුද්ද ප්‍රත්‍යවේක්ෂාවෙන් සිව්පස පරිභෝජනය සාමණේර ජීවිතයෙන් බොහෝ දුරට ඈත්වී ඇත. මහානායක අනුනායක පළාත් නායක ආදී වශයෙන් කොතෙකුත් ශාසන භාරධාරී මහ තෙරුන් වහන්සේ ඇතත් මේ ගැන කිසිම අවධානයක් නොකරන බව පෙනී යයි.

බුදුරදුන් දවස එක් තරුණ භික්ෂුවකට පියාගෙන් කහවණු සියක් ලැබී සිවුරු හැර යන්නට සූදානම් විය. බුදුරජාණන් වහන්සේ එම අදහස ඉතා සියුම් ලෙස අත්හැරවීය. අදත් එය කළ හැකිය. කරන්නට නිසි ආගමික නායකත්වයක් නැත.

# මෙලොව ගැනම සිතනු එපා

එක් රැස් කරපු වස්තුව නෑ ගෙනි යන්නේ
සියළුම වස්තු දාලයි අපි මිය යන්නේ
කලහොඳ නරක ලෙස සැප දුක සිදු වන්නේ
පරලොව දුක-සැපත මෙලෙසය සැළ සෙන්නේ

නොයෙකුත් පාප කම් කරකර විඳින සැප
පරලොව ගියදාට විඳවයි නැතිව ඇප
එලොව- මෙලොව දෙක ඇත පව- පිනට කැප
දෙලොව සැපට කළයුතු හොඳ දෙයය අප

අතැඹුල ලෙසින් දැක දෙසු තුන්ලෝ සතට
දසමුල් හිමි සඳුගෙ සඳහම් ගෙන සිතට
වැඩ නොකළොතින් බරවී වරදට පවට
දුකමය ඔහුට එලොවත්-මෙලොවත් දෙකට

මෙලොව පමණක්ය සිතමින් පව් කරතත්
එලොව ගිය දාට එය ගිනි ලෙස පළදෙන්
එලොව මෙලොව දෙක ඇත මළ දා විසදෙන්
තිලොව පියාගේ බණ දම් නම බොරුනැත්

නුවණ ඇති පිංවතුනි දැන මේ කරුණු
දොලොවෙම සැප විඳින්නට සිතමින් දියුණු
මෙලොව හොඳින් ඔබ ජීවිත ගත කරණු
දෙලොවෙම සැප විඳින්නට හැමවිට සිතණු

බුදුසරණ
**2000.07.08**

# සම්බුදු මව්පිය සුවය

මාස දහයක් කුසේ දරලා මෙලොව අරණළු පෙන්වූ     අම්මා
දාසයෙකු සේ මගේ කැත කුණු අතගගා දුක් වින්ද     අම්මා
කුසට ගින්දර නොදී ලේ කිරි බවට හරවා පෙවූ     අම්මා
වාස භවනක දෙව්ලොවේ සැප විඳිනු නිවනට යන්න     අම්මා

විලි වසන්නට නොයෙක් රෙදිපිළි ගෙනත් පැළඳුවේ     පියා
මැලි නොවී සිප් සතර දෙන්නට දිවා රෑ දුක් විඳි     පියා
පිළිසරණ ම දල සෙනෙවියක් සේ කුළුණු අවියෙන්දුන්     පියා
දිලි රන්තරුවක් ලෙස දිලී මතු නිවන් දොර වෙත යනු     පියා

කුසට අහරක් ගතට ඇඳුමක් නුදුන්නා මට බුදු     පියා
හිසට සෙවනක් පයට මිරිවැඩි නුදුන්නා මට බුදු     පියා
ලෙඩට බෙහෙතක් කයට සුවයක් නුදුන්නා මට බුදු     පියා
කණට බණ පද නිවනෙ සැනසුම දුන්නෙ ලොව්තුරා බුදු     පියා

බුදුසරණ
2011.11.02

## සැබෑ මිනිස් ගුණ

ලොව්තුරු බුදුපියා අපගේ අසම සම
වදහළ මිනිස් ගුණ පැහැදිලි කරමි මම
ඉවසමු කරුණාව සතවෙත මෙත් වැඩුම
මිනිසෙකු තුළ තිබිය යුතු ගුණ වෙයි නියම

තම දිවියෙන් අනුනට නිති උපකාර
කළහොත් මිනිස් නාමෙට වෙයි උපහාර
දෙලොවට පිහිටවන යහගුණයකි සාර
මව්පිය ගුරු බැතිය රැක්කොත් අතනෑර

පැසසුම සතුට ලාබය ආදී විලස
නින්දා අපහාස ගැරහුම් නොයෙක් ලෙස
ඉවසුව මැනවි යොමුකොට තම නුවන් ඇස
විඳගෙන උතුම් සම්බුදු හිමි දහම් රස

විපතක් වූ විටෙක යමෙකුට ඔබේ හිත
කකියන ගතිය ඇත්නම් කරුණාව ඇත
පිහිටක් වීම සුදුසුයි නොබලා පිටත
පැහැදිලි කරයි මේ බව උතුම් බණ පොත

ඉවසුම කරුණාව හා මෙත් ගුණ වැඩුම
අනුනට උපකාරවීමේ බුදු දහම
මව්පිය ගුරු බැතිය රැක ගෙන හැම දිනම
අත්කර ගනු මැනවි අජරාමර සැපම

බුදුසරණ
**2000.07.08**

අකුරේගොඩ රතනසාර හිමි
[illegible]
රන්වල
බෙලිගල. (ස.ප.)



වැලිතර ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාරයේ බුදු මැදුර

මුද්‍රණය : සක්වා ප්‍රින්ටර්ස්, 51 ඒ, කුලරත්න පාර, අම්බලන්ගොඩ.
දුරකථනය : 091-2258756 E-mail : sakvaprinters@gmail.com